# 7 ශ්‍රේණිය සිංහල

## 16 ඒකකය

# සකි සඳ පෙනේ - සමනොළ ගල නැගෙනගිර




සැකසුම - හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)


පසුගිය සතියේ online පංතිය සඳහා සහභාගී වීමට නොහැකි වූනු සිසුන් සඳහා සහභාගී වූ සිසුන්ගේ උපකරයෙන් ලබා දුන් උපකාරක සටහනකි.


Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

# සකි සඳ පෙණේ - සමනොළ ගල නැගෙනහිර

16

Anuhas



සුර රද සමන් සමගින් එවර
පැහැපත් මදාරා පරසතු මල් පතර
කැරපුළ වඩිනා රැඳී මුනි සිරිපා පවර
සකි සඳ පෙණේ සමනොළ ගල නැගෙනහිර

සමනොළ කන්ද දිවයිනේ කඳු පද්ධතියෙහි විශේෂ වැදගත්කමක් උසුලන කඳු වැටියකි. ස්වභාවික පාරිසරික සාධක වන ශාක හා සත්ත්ව ව්‍යාප්තියේ විශේෂතා ඒ අතරින් ප්‍රමුඛ වේ. සමනොළ කන්ද ලෝක වාසී ජනයා ඒකාබද්ධ කරන ස්මාරකයක් සේ සැලකිය හැකි ය.

- බෞද්ධයන්ගේ විශ්වාසය - බුදුන් වහන්සේ පා සටහන.
- හින්දු විශ්වාස - ශිව දෙවියන්ගේ පා සටහන.
- මුස්ලිම් හා ක්‍රිස්තියානි විශ්වාසය - ආදම් වාසය කළ පාරාදීසය බව

## ලිඛිත අභ්‍යාස

1. වරහන් තුළින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා පහත සඳහන් වාක්‍යවල හිස්තැන් සම්පූර්ණ කරන්න.

   i. සමන්ත කූටය .............................. (විෂ්ණු/කතරගම/සමන්) දෙවියන්ගේ වාසභූමිය සේ සැලකෙයි.

   ii. ශ්‍රී පාදස්ථානය මුහුදු මට්ටමේ සිට අඩි .............................. (7260ක්/8560ක්/7360ක්) උසින් පිහිටා ඇත.

   iii. මුල් ම වතාවට සිරිපා වඳින්නට යන්නා .......................... (නඩේ ගුරා/කෝඩුකාරයා/කරුණාවන්තයා) යන නමින් හැඳින්වේ.

   iv. සිරිපා කරුණා කරන සෑම දෙනා ම .......................... (නල්ලතන්නිය/ ලිහිණි හෙළ/සීත ගඟුල) පසු කරති.

   v. රජ මාවත ලෙස පිළිගනු ලබන්නේ ............................ (පලාබද්දල/කුරුවිට/හැටන්) පසු කරමින් මළුව වෙත කරුණා කරන මාවත යි.

   vi. සිරිපා වඳින්නට ගිය රජවරුන්ගේ නම් අතර සඳහන් නො වන්නේ ..................... (වළගම්බා/මහා පරාක්‍රමබාහු/දුටුගැමුණු) රජතුමාගේ නම ය.

   vii. සිරිපා අවාරය වන්නේ ..................... (උඳුවප් පෝදා සිට නවම් පෝදා දක්වා/උඳුවප් පෝදා සිට වෙසක් පෝදා දක්වා/වෙසක් පෝදා සිට උඳුවප් පෝදා දක්වා) කාලය යි.

   viii. ශ්‍රී පාද ලාංඡනය නමඳින්නට යන ගමනේ දී අසන්නට නො ලැබෙන්නේ ..................... (සැහැල්ලුව/සංහිඳේ/නගිමු) යන වචනය යි.

   xi. ශ්‍රී පාදස්ථානය වෙනුවෙන් ගම්වර පූජා කළේ ..................... (සෙල්ලිපිවල/ ටැම්ලිපිවල/විදේශීය වාර්තාවල) සටහන් තබමිනි.

   x. ශ්‍රී පාදස්ථානය වැඩි දියුණු කිරීමේ ගෞරවය හිමි වන්නේ ..................... (ශ්‍රී වික්‍රම රාජසිංහ/කීර්ති ශ්‍රී රාජසිංහ/සීතාවක රාජසිංහ) රජතුමාට ය.

ලිඛිත අභ්‍යාසය

1 (i) සමන්

(ii) 7360

(iii) කෝඩුකාරයා

(iv) සීත ගඟුල

(v) පලාබද්දල

(vi) දුටුගැමුණු

(vii) වෙසක් පෝදා සිට උඳුවප් පෝදා දක්වා

(viii) නාගිමු

(ix) පෙල්ලිපිටල

(x) කීර්ති ශ්‍රී රාජසිංහ.

2. පහත සඳහන් පදවලට සමාන අර්ථය දෙන පද ලියන්න.

| | | |
|---|---|---|
| i. ලාංඡනය | viii. රුව | xv. ප්‍රාකාරය |
| ii. කූටය | ix. මළුව | xvi. ප්‍රතිසංස්කරණය |
| iii. නැටුමක් | x. දැස | xvii. කුලුනු |
| iv. සුන්දර | xi. බෙල්ල | xviii. බෞද්ධ |
| v. සේන්දු වීම | xii. ගෞත්තම් | xix. සතු |
| vi. වෙසක් | xiii. නාදය | xx. මාතාව |
| vii. උපහාරය | xiv. ඉඳුනිල්මිණි | |

2 (i) ලකුණ

(ii) කන්ද / පර්වතය

(iii) නර්තනයක්

(iv) අලංකාර

(v) ළඟා වීම.

(vi) වෛශාඛය / මැයි

(vii) ගෞරවය / පූජ්‍යාමය

(viii) රැජය

(ix) මිදුල / අංගනය

(x) දෙපුවන් / දෙවිනෙත්

(xi) මැහුම්

(xii) ගෙල

(xiii) පාඩ

(xiv) ඉඳුනිල්මිණි මාණික්‍ය ඉන්ද්‍රනීල

(xv) පබුර

(xvi) අලුත්වැඩියාව

(xvii) කත්‍ර

(xviii) බොදු

(xix) සන්තක

(xx) මෑණි, අම්මා

## ප්‍රායෝගික අභ්‍යාස

1. කණ්ඩායම්වලට බෙදී තුන්සරණේ කවි ගායනා කරන්න.
2. 'ශ්‍රී පාදස්ථානය' නමින් බිත්ති පුවත්පතක කලාපයක් නිර්මාණය කරන්න.
3. ශ්‍රී පාද ලාංඡනය, සමනොළ කන්ද ඇසුරෙන් නිර්මාණය වූ ගීත එක් රැස් කර පන්තිය ඉදිරියේ ගායනා කරන්න.

   උදා : i. සිරිපාදේ සමනොළ කන්ද පෙනේ - ආලෝකය සමන් කුළේ...

   ii. මුනි නන්දන සිරිපාද වදිම් සමනොළ කන්දේ විහිදෙන මෝක්ෂ සුගන්දේ...

## ප්‍රායෝගික අභ්‍යාස

### ශ්‍රී පාදස්ථානය

අපේ රට තුළ කඳු තැනින් තැන දක්නට ලැබේ. මෙම කඳු අතර අප රට තුළ තෙවැනි~~යට~~ උසම කන්ද වන ශ්‍රී පාදස්ථානය හෙවත් සමනොළ කන්ද දක්නට ලැබේ. මෙය කන්දක් වුවත් ~~මිනිසුන්~~ මිනිස්සු මෙය පූජනීය ස්ථානයක් බව ~~සලකයි~~ සලකති. ශ්‍රී පාද සමය වන විට මෙහි සමනලුන් ඇති බව පැවසේ.

මේ අතර බෞද්ධ ජනතාව විසින් මෙය හඳුන්වන්නේ බුදුරජාණන් වහන්සේ තුන්වැ කර රට ලංකාවට වැඩම කරන විට එහිදී සුමන සමන් දෙවියන් එම ගමනේ දී කළ ආරාධනයකින් එයට වඩින ලෙස ඉල්ලීමක් කළ අතර එහිදී බුදුරජාණන් වහන්සේ එම ඉල්ලීම පිළිගෙන සමනොළ කන්දට වැඩම කර එම පාදයේ සලකුණ පිහිට වූ බව ~~මිනිසුන් සලකති~~ ඔවුහු විශ්වාස කරති.

මේ අතර මෙම ශ්‍රී පාදස්ථානය පිළිබඳව ඇදහිලි විශ්වාස, ජනප්‍රවාද තබාගෙන ඇත්තේ බෞද්ධයන් පමණක් නොව අනික් ජාතීන් ද ශ්‍රී පාදස්ථානය පිළිබඳව විවිධ ~~ජන ජන~~ ජනප්‍රවාද ඇත. හින්දු ජනතාව පවසන්නේ මෙම පාදය ශිව දෙවියන්ගේ බවයි. එම නිසා ශිව භක්තිකයින් මෙම ශ්‍රී පාදස්ථානය හඳුන්වන්නේ "ශිවනොළි පාදම්" ලෙසයි. ඉස්ලාම් සහ ක්‍රිස්තියානි ජනතාව පවසන්නේ මෙය ආදම්ගේ පා සටහන බවත් මෙය ආදම්ගේ පාරාදීසය බවත් ය.

ශ්‍රී පාදස්ථානයේ කරුණා කරන විට මකර තොරණ, සීත ගඟුල, අහස් ගව්ව, භාරම්ටිපාන, ලිහිණිගෙළ, ඉඳිකටුපාන, ගෙත්තම්පාන, ධර්මරාජගල, ගෝන කැටේන, ඇහැළ කන්ද, මහ ගිරි දඹය, සිරිපා මළුව, සීතා දොළොස් මහේ පහන ~~සහ~~ ආදිය පසු කර යුතු ය. සිරිපා මළුවට ගොස් සන්තර්පණය කමත් ගිය චාර ගත්‍රා අඳුට අන්තරාය ගැනිය යුතු ය. මෙහිදී පළමු වතාවට ශ්‍රී පාදය වන්දනා කරන මිනිසුන් කෝඩුකාරයා ලෙස හඳුන්වයි. කිසියම් කණ්ඩායමකින් හොඳට දැන පුරුදු ඇති නායකයා නඩේ ගුරා ලෙස හඳුන්වනු ලැබේ.

මෙම ශ්‍රී පාදස්ථානයට ආවේණික සත්ත්ව විශේෂ කිහිපයක් ඇත. මෙහි විශාල ක්ෂීරපායී සත්ත්වයා වන්නේ ශ්‍රී ලංකා අළු වඳුරා වේ. මෙහි පක්ෂි වර්ග බොහෝ සේ දක්නට ලැබේ. මහ කවුඩා සහ රතු දෙමළිච්චා ඒ අතරින් විශේෂ වේ. පක්ෂි රංචුවක සිටින ප්‍රචණ්ඩකාරී පක්ෂියා ලෙස මහ කවුඩා ද ශෝභාකාරී පක්ෂියා ලෙස රතු දෙමළිච්චා ද හඳුන්වයි. පෙර කී ලෙස ~~සමනලයින්~~ ශ්‍රී පාද සමය වන විට ~~පැමිණෙයි~~. සමනල්ලු පැමිණෙති. මිනිසුන් පවසන්නේ සමනලයින් සිරිපා සමය වන්දනා කිරීමට පැමිණෙන බවයි. මෙම ශ්‍රී පාදස්ථානය මුළු ශ්‍රී ලංකාවට ම මහත් ආශිර්වාදයකි.

## තනි පද

* තනි පද යනුවෙන් හැඳින්වෙන්නේ පද කිහිපයකින් හෝ වාක්‍යාංශයකින් හෝ දැක්වෙන අදහසක් එක් පදයකින් දැක්වීමයි.

උදා: සුරලොව - දෙවියන් වැඩ වසන ලෝකය

නරලොව - මිනිසුන් ජීවත් වන ලෝකය

ගුප්ත - නියම ස්වරූපය සැඟවී පවතින.

කෝඩුකාරයා - පළමු වතාවට සිරිත කරණා කරන්නා

හබේගුරා - සිරිත කරණා කරන කණ්ඩායමේ නායකයා

ප්‍රතිසංස්කරණය - නැවත සකස් කිරීම.

ගම්වර - විහාර, දේවාලය ආදියේ නඩත්තුව සඳහා පූජා කරන ඉඩම්.

සෙල්ලිපි - ගලෙහි කෙටූ ලියවිලි.

## ලිඛිත අභ්‍යාස


1. 'අ' තීරුව හා 'ආ' තීරුව යා කරන්න.

| | 'අ' | 'ආ' |
|---|---|---|
| 1. | කිසිවෙකුට බැඳීමක් නැති | පෙතිකඩ |
| 2. | හඬ නගා කරන තර්ජනය | දේවදාසි |
| 3. | රජුගේ ඇත් හල භාර ප්‍රධානියා | කිම්දෙන |
| 4. | ගස්, කොළ, ගෙඩි ආදියේ ඇති බූව | අනුස්මරණය |
| 5. | පට පණුවාගෙන් තනන රෙදි | මසුරු |
| 6. | මිල මුදල් ඇතත් අනුනට නො දෙන | සේද රෙදි |
| 7. | යමෙකු හෝ යමක් සිහිපත් කිරීම | සුඹුළු |
| 8. | දිය යට යන | ගජනායක |
| 9. | දෙවියන්ගේ ආවතේව සඳහා කැප වූ ස්ත්‍රිය | ගෝරනාඩුව |
| 10. | සිතුවම් අඳින ලද වස්ත්‍රය | ස්වෛරී |

2. පහත සඳහන් වාක්‍යවල තද කළු අකුරෙන් යෙදී ඇති වාක්‍යාංශ වෙනුවට තනි පද යොදා වාක්‍යය නැවත ලියන්න.

   1. **ජනයා බහුලව වාසය කරන** ප්‍රදේශවල පරිසර දූෂණය ද බහුල ය.
   2. මෙවර **සී සෑම, වැපිරීම පිළිබඳ උත්සවය** පැවැත්වුණේ රාජ්‍ය අනුග්‍රහයෙනි.
   3. **කළ වරද ගැන කනගාටු වීමට** වඩා වැරදි නො කර සිටීම වැදගත් වේ.
   4. විජය රජතුමා පිළිබඳ **අතීත කතා පුවත** ක්‍රිස්තු පූර්ව යුගය දක්වා දිවෙයි.
   5. **යම් කාර්යයක් කර ගැනීමට නීත්‍යානුකූල නො වන ආකාරයට දෙන ත්‍යාගය** ලබා ගන්නා ද ලබා දෙන්නා ද නීතිය ඉදිරියේ වරදකරුවෝ ය.

6. තමා උපන් භූමිය වෙනුවෙන් ජීවිතය පූජා කළ රණවිරුවෝ අප සිත් තුළ සදාකල් ජීවත් වෙති.
7. තමා ගැන පමණක් සිතා කටයුතු කරන්නා මුළු මහත් සමාජයට ම පිළිලයකි.
8. දිරා ගිය රෙදි කැබැල්ලක් හැඳ සිටි යාචක ස්ත්‍රියට අම්මා මල් මල් චීත්තයක් දුන්නා ය.
9. ඉතා වේගයෙන් ධාවනය කරන බසයකට ඔහු ගොඩ වූයේ කල්වේලා ඇතිව නිවසට යෑමට ය.
10. දින තිහක කාලයක් තිස්සේ කය වෙහෙසා වැඩ කර උපයා ගන්නා වැටුප් ජීවත් වීමට තරම් ප්‍රමාණවත් නැතැයි උද්ඝෝෂකයෝ පවසති.



② (i) ජනාකීර්ණ

(ii) , චර්මලු

(iii) පසුතැවීම

(iv) ඉතිහාසය

(v) ආලුවළ

(vi) ළව්බිම.

(vii) ආත්මාර්ථකාමිතා

(viii) වැරහිල්ලක්

(ix) අධිවේගී

(x) මාසයක්

## ප්‍රායෝගික අභ්‍යාස

1. තනි පද දහයක් ලියා ඒවා විස්තර කර දක්වන්න.

2. ඔබගේ යහළුවකු සමග තනි පද කීමේ තරගයක යෙදෙන්න. එක් නිවැරදි පිළිතුරකට ලකුණු බැගින් ලබා දී ජයග්‍රාහකයා සොයන්න.

# ප්‍රායෝගික අභ්‍යාස

(1)
1. කුරුළු බැඳ යන වේලාව - ගොම්මන
2. උයන් මුරකරන්නා - උයන්පල්ලා
3. නිවසේ හිමිකරුවා - ගෙහිමියා
4. ඇසින් දැකිය හැකි - දෘශ්‍යමාන
5. කෑම උයන්නා - අරක්කැමියා
6. කෑමට ඉතා ප්‍රිය - කෑදර
7. ඉබේ ක්‍රියා කරන - ස්වයංක්‍රීය
8. කිරි බී වැඩෙන - ක්ෂීරපායී
9. යකඩින් කරන ලද - අයෝමය
10. උපතේ [illegible] - [illegible]

# ගුරු අත් පොතෙන්.....

ඇමුණුම - 1

පහත සඳහන් වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත පද සඳහා සුදුසු තනි පද වරහනින් තෝරා වාක්‍ය නැවත ලියන්න.

1. **බොහෝ දුර දකින** නායකයෝ සමාජයට යහපතක් කරන්නෝ ය.
2. **උපතින් ලද නුවණක්** සහිත මහෞෂධ පඬිතුමා එරට බොහෝ ගැටලු විසඳුවේ ය.
3. **හිරු අවරට යාමෙන් පසු ආහාර අනුභව කිරීම** භික්ෂූන් වහන්සේට අකැප ය.
4. **සිය දේශයට විරුද්ධ ක්‍රියාවන්හි** නියැලීම නුසුදුසු ය.
5. **පුරාණ කාලයට අයත්** සාහිත්‍යය පොත් පත් පරිශීලනය භාෂා පෝෂණයට ඉවහල් වේ.
6. **පහ වූ රාග ක්ලේශ ඇති** උතුමෝ අතීත ලංකාවෙහි විසූහ.
7. ජිවිතය යහපත් කර ගැනීම සඳහා **අන්‍යයන් දෙන උපදේශ** සිහිනුවණින් පිළිපැදිය යුතු ය.
8. කුරුණෑගල රාජධානිය **පර්වත ආදියෙන් වට වී තිබූ** නිසා රජවරුන්ට ආරක්ෂා සහිත ස්ථානයක් විය.
9. නාට්‍යයක ප්‍රධාන අරමුණ වන්නේ **රස ජනනය කිරීම** යි.
10. **නොයෙක් දේශයන්හි සැරිසැරූ** භික්ෂුවක වූ පාහියන් ලංකාවට ද පැමිණියේ ය.

(රසෝත්පත්තිය, ගිරිදුර්ග, දේශාටක, පරෝපදේශ, දූරදර්ශී, විකාලභෝජනය, පෞරාණික, දේශද්‍රෝහී, සහබුද්ධිය, නික්ලේශී)

① බොහෝ දුර දකින - දූරදර්ශී
② උපතින් ලද නුවණක් - සහබුද්ධිය
③ හිරු අවරට යාමෙන් පසු ආහාර අනුභව කිරීම - විකාලභෝජනය
④ සිය දේශයට විරුද්ධ ක්‍රියාවන් - දේශද්‍රෝහී
⑤ පුරාණ කාලයට අයත් - පෞරාණික.
⑥ පහ වූ රාග ක්ලේශ ඇති - නික්ලේශී
⑦ අන්‍යයන් දෙන උපදේශ - පරෝපදේශ
⑧ පර්වත ආදියෙන් වට වී තිබූ - ගිරිදුර්ග
⑨ රස ජනනය කිරීම - රසෝත්පත්තිය
⑩ නොයෙක් දේශයන්හි සැරිසැරූ - දේශාටක

# සකි සඳ පෙනේ - සමනොළ ගල නැගෙනහිර

## *16 පාඩම - ඇගයීම*

1) සැලළිහිණි සංදේශයේ කතුවරයා කවුරුන් ද?
2) සමන්ත කූටයට අධිපති දෙවියන් සේ සැලකෙන්නේ කවුරුන් ද?
3) බුදුන් වහන්සේ තෙවන වර ලංකාවට වැඩි අවස්ථාවේ දිවා විහරණය කළ ස්ථානය කුමක් ද?
4) "සමන්ත කූට වර්ණනාව" නම් ග්‍රන්ථයෙහි රචකයා කවුරුන් ද?
5) ශ්‍රීපාද ලාංඡනයෙහි සටහන්ව ඇති මඟුල් ලකුණු සංඛ්‍යාව කීය ද?
6) සමන්ත කූට පර්වතය පිහිටියේ කුමන පළාතේ ද?
7) මුහුදු මට්ටමේ සිට කොපමණ උසකින් සමන්ත කූටය පිහිටා තිබේ ද?
8) සමනොළ කන්දේ ඇති පා සටහන ආදම්ගේ බව විශ්වාස කරන්නේ කවුරුන් ද?
9) ශිව භක්තිකයන් සමනොළ කන්ද හඳුන්වන්නේ කුමන නමකින් ද?

10) සිරිපා වන්දනාවේ යෙදුණු අතීත රජදරුවන් තිදෙනෙක් නම් කරන්න.

11) ශ්‍රීපාද ලාංඡනයට රතු රෙදි පිදීම සිදු කරනු ලබන්නේ කුමන ජාතිකයන් ද?

12) බැතිමත්හු සිරිපා වන්දනාවේ යෙදෙන්නේ කුමන කාල සීමාවේ ද?

13) සුමන සමන් දෙවි රුව සිරිපා අවාරයේ වැඩ වෙසෙන්නේ කුමන විහාරයේ ද?

14) ඔබ අසා ඇති තුන් සරණේ කවියක් ලියන්න.

15) පෙර රජ දරුවන් ශ්‍රීපාදස්ථානයට ගම්වර පූජා කළ බව සඳහන් සෙල්ලිපි මොනවා ද?

16) සිරිපා ලකුණ පිළිබඳ සටහන් තැබූ විදේශිකයෝ තිදෙනෙක් නම් කරන්න.

17) ශ්‍රීපාදස්ථානය පාදක කොට ගත් සාහිත්‍ය නිර්මාණ 3 ක් නම් කරන්න.

18) ශ්‍රී පාද ලාංඡනය, සමනොළ කන්ද ඇසුරෙන් නිර්මාණය වූ ගීතයක කොටසක් සොයා ලියන්න.

## 16 පාඩම - ඇගයීම

95%

1. තොටගමුවේ ශ්‍රී රාහුල හිමි
2. සමන් දෙවියෝ
3. ශ්‍රී පාදස්ථානය දිවා ගුහාව
4. උඩරට පිරුවන්පත් වේදේහ හිමි.
5. 108 ක්
6. සබරගමුව පළාත
7. 7360 කි
8. ක්‍රිස්තියානි හා ඉස්ලාම් ආගමිකයින්.
9. සිවනොළි පාදම්
10. වළගම්බා රජු
    සිවුවන විහිඳු රජු
    මහා පරාක්‍රමබාහු රජු.
11. හින්දු භක්තිකයින්
12. උඳුවප් පෝදා සිට වෙසක් පෝදා දක්වා
13. ගල්පොත්තාවල රජ මහා විහාරයේ

14. බුද්ධං සරණං සිරස දරා ගෙන
ධම්මං සරණේ සිත පහදා ගෙන
සංඝං සරණේ සිවුරු දරා ගෙන
ඉන්දුණුදුයි තුන් සරණේ අදහා ගෙන.

15. අඹගමුව සෙල්ලිපිය
ශ්‍රී නිශ්ශංකමල්ල සෙල්ලිපිය.
ගිලිමලේ සෙල්ලිපිය.

16. මහා ඇලෙක්සැන්ඩර් රජ
අරාබි ජාතික අල්ඉද්‍රිසී
රොබට් නොක්ස්

17. සමනල හැල්ල
සමන් ගිරිත
හිරෝළාද්‍රිය.

18. සිරි පාදේ සමනල කන්ද පෙළෙන්
ආලෝකය සමන් පුරේ
හඳ පානේ මහා වන දිහා බලා
සුදු රිදී කඳුන් හමුවේ.

Anuhas

# <u>සකි සඳ පෙනේ - සමනොළ ගල නැගෙනහිර</u>

## ***<u>16 පාඩම - පිළිතුරු පත්‍රය</u>***

1)තොටගමුවේ ශ්‍රී රාහුල හිමි

2)සුමන සමන් දිව්‍ය රාජයා

3)දිවා ගුහාව

4)පතිරජ පිරුවන්පති  වේදේහ හිමි

5)108

6)සබරගමුව පළාතේ

7)අඩි 7360

8)මුස්ලිම්වරු

9)ශිවනොළි පාදම්

10) වළගම්බා රජතුමා, සිවුවන මිහිඳු රජතුමා, ශ්‍රී සංඝබෝධි රජතුමා, විජයබාහු රජතුමා, මහා පරාක්‍රමබාහු රජතුමා, කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජතුමා, කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත පරාක්‍රමබාහු රජතුමා, බෝසත් විජයබාහු රජතුමා, හය වන පරාක්‍රමබාහු රජතුමා, දෙවන විමලධර්මසූරිය රජතුමා, ශ්‍රී විජය රාජසිංහ රජතුමා

11) හින්දුවරු

12) උඳුවප් පෝදා සිට වෙසක් පෝය දා දක්වා කාලය

13) ගල්පොත්තාවල රජ මහා විහාරයේ

14) බුද්ධං සරණේ සිරස දරා ගෙන
ධම්මං සරණේ සිත පහදා ගෙන
සංසං සරණේ සිවුරු දරා ගෙන
ඉසැඳැයි තුන් සරණේ අදහා ගෙන

15) අඹගමු සෙල්ලිපිය, ගිලීමලේ සෙල්ලිපිය, ශ්‍රී නිශ්ශංකමල්ල සෙල්ලිපිය

16) මහා ඇලෙක්සැන්ඩර් රජ, අරාබි ජාතික සුලෙයිමාන්, ඉබන් බතුතා, පෘතුගීසි ජාතික ඔඩාරොඩෝ බාර්බොරසා, චීන ජාතික හියුංසාන්, ඉංග්‍රීසි ජාතික රොබට් නොක්ස්, ඇලන් වෝල්ටර්ස්, ඇමර්සන් ටෙනන්ට්, විලියම් ස්කීන්

17) සමන්තකූට වර්ණනාව, සමන් සිරිත, ශිරෝපාදය, සමනළ විස්තර, සමනල හැල්ල, අභිනව හිමගත වර්ණනාව, ශ්‍රී පාද අලංකාරය, සිරිපා වැඳුම, තුන් සරණය කවි

18) i) මුනි නන්දන සිරිපාද වදිම් සමනොළ කන්දේ
විහිදෙන මෝක්ෂ සුගන්දේ
මුනි නන්දන සිරිපාද වදිම් ශ්‍රී
ශාන්ති කරුණා ගුණ ආනන්දේ

ලැබීලා කරුණා ගුණ ආනන්දේ

පිහිටෙන් සුමන සුරින්දේ සිතු පැහැදේ ....

ii) සිරිපාදේ සමනොළ කන්ද පෙනේ

ආලෝකය සමන් පුරේ

හඳපානේ මහ වන දිහා බලා

සුදු රිදී කඳන් හමුවේ

අර මහ මළුවේ සිරි පාද පියුම්

වැඳ සාදු කියා එනවා //

නාදෙ ඇසෙන්නේ ඒ සණ්ටාරේ

මේ උතුම් පෝදා //

කරුණාවයි දෙවින්දේ

මේ සුමන සමන් සුරින්දේ //

නාදෙ ඇසෙන්නේ ඒ සණ්ටාරේ

මේ උතුම් පෝදා //

නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege

## නාලන්දා විද්‍යාලය - කොළඹ 10
### ඒකක පරීක්ෂණය - 2020
### සිංහල භාෂාව
### 7 ශ්‍රේණිය

කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10

**16 - ඒකකය**

**<u>සකි සඳ පෙනේ සමනොළ ගල නැගෙනහිර</u>**

- **නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.**

01.(i) සමන්ත කූටය ............................ ( විෂ්ණු / කතරගම / සමන් ) දෙවියන්ගේ වාසභූමිය ලෙස සැලකෙයි.

(ii) ශ්‍රී පාදස්ථානය මුහුදු මට්ටමේ සිට අඩි .................... ( 7260 ක් / 4560 ක් / 7360 ක් ) උසින් පිහිටා ඇත.

(iii) සිරිපා කරුණා කරන සැම දෙනාම .................... ( නල්ලතන්නිය / ලිහිණි හෙළ / සීත ගඟුල )

පසු කරති.

(iv) රජ මාවත ලෙස පිළිගනු ලබන්නේ .................... ( පලාබද්දල / කුරුවිට / හැටන් ) පසු කරමින් මළුව වෙත කරුණා කරන මාර්ගය යි.

(v) මුල් ම වතාවට සිරිපා .................... වඳින්නට යන්නා ( නඩේ ගුරා / කෝඩුකාරයා / කරුණාවන්තයා ) යන නමින් හැඳින්වේ.

(vi) ශ්‍රී පාදස්ථානය වෙනුවෙන් ගම්වර පූජා කළේ .................... ( සෙල්ලිපිවල / ටැම් ලිපි වල/ විදේශීය වාර්තා වල ) සටහන් තබමිනි.

(2) **පහත සඳහන් පදවලට සමාන අර්ථය දෙන පද ලියන්න.**

(i) ලාංඡනය ............................................

(ii) කූටය ............................................

(iii) මළුව ............................................

(iv) කුලුනු ............................................

(v) ප්‍රාකාරය ............................................

(vi) ප්‍රතිසංස්කරණය ............................................

(vii) ගෙත්තම් ............................................

(3) **පහත සඳහන් වාක්‍ය වෙනුවට තනි පද රවුම තුළින් තෝරා ලියන්න.**

(i) හිරු නැගෙන දිසාව ……………………………..

(ii) පැරණි කාලයට අයත් ……………………………..

(iii) අධික වේගයෙන් ධාවනය වන ……………………………..

(iv) තමාගේ මතයට කටයුතු කරන ……………………………..

(v) යමක් නැවත අලුත්වැඩියා කිරීම ……………………………..

(vi) සිනා උපදවන්නා වූ ……………………………..

(vii) ඇඳුම් මසන තැනැත්තා ……………………………..

ශීඝ්‍රගාමී , අත්තනෝමතික
ප්‍රතිසංස්කරණය, සන්නාලියා,
නැගෙනහිර , ස්මාරකය
පෞරාණික , අද්විතීය
හාස්‍යජනක , අතිශයෝක්තිය

(4) **පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(i) ශ්‍රී පාදස්ථානය '' ශිව නොළි පාදම් '' යනුවෙන් හඳුන්වන්නේ කවර භක්තිකයින් ද ?

(ii) පෙර රජ දරුවන් ශ්‍රී පාදස්ථානයට පූජා කළ '' ගම්වර '' ගැන සඳහන් වන සෙල්ලිපි තුනක් නම් කරන්න.

(iii) මෙම ආගමික ස්ථානය ජනාදරයට පත් වන්නේ කවර යුගයක සිට ද ?

Anuhas

නාලන්දා විද්‍යාලය - කොළඹ 10
ඒකක පරීක්ෂණය - 2020
සිංහල භාෂාව
7 ශ්‍රේණිය

93%

16 ඒකකය.

1 (i) කළඹේ
(ii) 7360ක්
(iii) සීතා ගඟුල
(iv) පලාබද්දල
(v) කෝඩුකාරයා
(vi) සෙල්ලිපිවල

2 (i) සලකුණ
(ii) කන්ද
(iii) මිදුල
(iv) කෂ්ට
(v) පවුර
(vi) අලුත්වැඩියාව.
(vii) මැදුම.

3 (i) නැගෙනහිර
(ii) පෞරාණික.
(iii) අද්විතීය ශීඝ්‍රගාමී
(iv) අත්‍යන්තෝමතික
(v) ප්‍රතිසංස්කරණය.
(vi) භාෂාඥයන්.
(vii) සන්නාලිය

4 (i) හින්දු භක්තිකයින්.
(ii) අඹගමුව සෙල්ලිපිය
කලිටලේ සෙල්ලිපිය
ශ්‍රී නිශ්ශංකමල්ල සෙල්ලිපිය
(iii) 1940 දී ක්‍රි. පූ. 323 දී පමණ